# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 6 දරන ගමනාගමන මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 පෙබරවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැක

මිළ : ශත 35 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

1981 අංක 6 දරන ගමනාගමන මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 1/80.

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 6 දරන ගමනාගමන මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 21 වන වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන පනතේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මධ්‍යම මණ්ඩලය විසින්—

(අ) මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපළ රක්ෂණය පිය වීම සඳහා ද, තෘතීය පාර්ශ්ව අවදානම්වලින් උද්ගත වන්නා වූ වගකීම් පියවීම සහ කම්කරු වන්දි ආඥාපනත යටතේ උද්ගත වන්නා වූ වග කීම් පියවීම සඳහා ද රක්ෂණ සංචිතයක් පිහිටුවා, පවත්වාගෙන යා හැකි ය ; තව ද

(ආ) (i) මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපළවල අගය ක්ෂයවීම පියවීම සඳහා ක්ෂය සංචිතයක් ; සහ

(ii) පොදු සංචිතයක්

පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

(2) සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින්—

(අ) මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපළ රක්ෂණය පියවීම සඳහා ද, තෘතීය පාර්ශ්ව අවදානම්වලින් උද්ගත වන්නා වූ වගකීම් පියවීම සඳහා සහ කම්කරු වන්දි ආඥාපනත යටතේ උද්ගත වන්නා වූ වගකීම් පියවීම සඳහා ද රක්ෂණ සංචිතයක් පිහිටුවා පවත්වාගෙන යා හැකි ය ; තව ද

(ආ) (i) මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපළවල අගය ක්ෂයවීම පියවීම සඳහා ක්ෂය සංචිතයක් ; සහ

(ii) පොදු සංචිතයක්,

පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

2- ඒ 52771—9.800 (80/11)

(3) (අ) (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් එක් එක් සංචිතයේ බැරට කලින් කල ඉදිරිපත් කළ යුතු මුදල්, අවස්ථාවෝචිත පරිදි මධ්‍යම මණ්ඩලය විසින් හෝ මධ්‍යම මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ඒ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් හෝ නිශ්චය කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(ආ) (1) (අ) සහ (2) (අ) උපවගන්තිවල සඳහන් රක්ෂණ සංචිතවල බැරට ඇති මුදල් ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ආආ) (ආ) ඡේදයෙහි සඳහන් අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් හැර, නියමිත දිනට ඉහතින් ම වූ දින පැවැති ලංකා ගමනාගමන මණ්ඩලයේ සියලුම අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම්, මධ්‍යම මණ්ඩලයේ අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය;".

35අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 35අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"මෝටර් වාහන පනතේ 99 (1) වන වගන්තිය ක්‍රියාත්මක කිරීමෙන් මධ්‍යම මණ්ඩලය සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල නිදහස් කිරීමේ බලය.

35අ. තෘතීය පාර්ශ්ව අවදානම් සම්බන්ධයෙන් උද්ගත වන්නා වූ වගකීම් පියවීමට ප්‍රමාණවත් වන්නා වූ රක්ෂණ සංචිතයක් මධ්‍යම මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් හෝ විසින් පිහිටුවා ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයේ සඳහන් කරනු ලබන්නා වූ දිනයක සිට, මෝටර් වාහන පනතේ 99 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙන් මධ්‍යම මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් නිදහස් කරනු ලැබිය හැකි ය.".

3 වන වගන්තිය අතීතයට බල පැවැත්වීම.

**5.** මේ පනතේ 3 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා, ඒ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී කාලාපගමන ආඥාපනත අදාළ නොවන බව.

**6.** ලංකා ගමනාගමන මණ්ඩලයට විරුද්ධව ඇති හිමිකම් පෑම් සම්බන්ධයෙන් කාලාපගමන ආඥාපනතේ කාර්ය සඳහා කාලය ආගණනය කිරීමේ දී, ප්‍රධාන ප්‍රඥප්තිය බලාත්මක වූ දිනය සහ මේ පනත ආරම්භ වූ දිනය අතර ඇති කාලය සැලකිල්ලට නොගත යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.